*සැ. යු.*—2007.07.20 දින පළකරන ලද අංක 1,507 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළනොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,508 — 2007 ජූලි මස 27 වැනි සිකුරාදා — 2007.07.27**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 748 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 756 |

(i) *සැ. යු.*– මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජූනි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී පියරතන ප්‍රජා සංවර්ධන සහ සමාජීය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජූනි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) හැම්පිටන් විලේජ් ශ්‍රී ලංකා භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජූලි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අගෝස්තු මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජූලි මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටී නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලිම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑ ම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වු කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිළධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වුත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවුත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාගාපේක්ෂකයන් සඳහා නීති හා උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතීන්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේඳි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

### දේශක/උපදේශක සඳහා බාහිර සම්පත් දායකයින් ලියාපදිංචි කිරීම 2007/2008 අධ්‍යයන වර්ෂය

මෙම දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාලවල දේශක/උපදේශක තනතුරු සඳහා බාහිර සම්පත් දායකයින් ලියාපදිංචි කිරීමට මෙම නිවේදනය අවසානයේ දක්වා තිබෙන කාර්මික විද්‍යාලවල විදුහල්පතිවරුන් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම කාර්මික විද්‍යාලවල දේශන පැවැත්වීමට නියමිතව තිබෙන විෂයයන් පිළිබඳ විස්තර සහ ආදර්ශ අයදුම්පත්‍රය තමා සේවය කිරීමට අදහස් කරන කාර්මික විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත (අඟල් 9 x 4 ප්‍රමාණයේ) තම ලිපිනය සහ මුද්දර ඇලවූ ලියුම් කවරයක් යැවීමෙන් ලබාගත හැකි වේ. ඔබ එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බාහිර සම්පත් දායකයින්" යනුවෙන් සඳහන් කරන්න. කාර්මික විද්‍යාලවලට පැමිණ මෙම විස්තර පත්‍රිකා ලබාගත හැක.

03. මෙම විස්තර පත්‍රිකා ලබාගත හැකි අවසාන දිනය 2007.08.22 වැනි දින වේ.

04. අපේක්ෂකයින් සඳහා පොදු විස්තර.

(i) අපේක්ෂකයින් විසින් තම අධ්‍යාපන, වෘත්තීය හා කාර්මික අංශයේ ලබා ඇති සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සියළුම විස්තර අයදුම්පත යැවීමේදී සඳහන් කිරීමට වග බලා ගත යුතුවේ.

(ii) *ගාස්තු ගෙවීම*
බාහිර සම්පත් දායකයින්ට ගෙවන ගාස්තුව ඔවුන්ගේ පළපුරුද්ද සුදුසුකම් හා පාඨමාලාවේ මට්ටම අනුව පැයකට රු. 125 සිට රු. 250 දක්වා වෙනස් වනු ඇත.

(*සටහන.*–මෙම ගාස්තු ඉදිරියේ සිදුවිය හැකි සංශෝධනවලට යටත්වේ.)

(iii) *ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීම*
රාජ්‍ය සේවයේ යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ යුත්තේ තම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ප්‍රධානියා මගිනි. මෙවැනි අපේක්ෂකයෙක් මෙම කාර්යය සඳහා තෝරා ගතහොත් එලෙස සේවයේ යෙදීම නිසා සිය රාජකාරී කටයුතුවලට බාධා නොවන බවට තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ස්වකීය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරවා ගැනීමට අපේක්ෂකයා විසින් වගබලා ගත යුතුවේ.

(iv) *තෝරා ගැනීම*
ලියාපදිංචි සඳහා තෝරා ගනු ලබන්නේ අදාළ කාර්මික විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් පසුවය. ඉගැන්වීමේ පළපුරුද්ද ඇති අපේක්ෂකයින්ට, තෝරා ගැනීමේදී ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. තෝරා ගනු ලබන අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය විද්‍යාලයේ අවශ්‍යතාවය අනුව කිසිම හේතුවක් නොදක්වා ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට විදුහල්පතිට හැකි බව ද සැලකිය යුතුවේ.

(v) මෙලෙස ලියාපදිංචි වන බාහිර සම්පත් දායකයින් දේශනවලට අදාළ වර්ෂයේ අවසාන අභ්‍යන්තර විභාග කිසිඳු අමතර ගාස්තුවක් නොමැතිව මෙහෙය විය යුතුවේ.

05. මෙම ලියාපදිංචිය 2007/2008 අධ්‍යයන වර්ෂය සඳහා පමණක් වන අතර, අවශ්‍යතාවය අනුව ඊට කලින් වුව ද අවසන් කළ හැක.

06. ඉල්ලුම්පත්‍ර එවීමේදී විෂයයන් එකකට වඩා ඉල්ලුම් කරන්නේ නම්, එක් එක් විෂය සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර එවිය යුතුවේ. මෙම සෑම අයදුම්පතක්ම අදාළ කාර්මික විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත ඔහු විසින් නියම කරන ලද අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුවේ.

ආචාර්ය එච්. එල්. ඔබේසේකර,
අධ්‍යක්ෂ ජනරාල්.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.
තැ. පෙ. 557, ඕල්කොට් මාවත,
කොළඹ 10.

*කාර්මික විද්‍යාල ලැයිස්තුව*

| *අනු අංකය* | *කාර්මික විද්‍යාලය* | *ලිපිනය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලය | ඕල්කොට් මාවත, කොළඹ 10 | කොළඹ |
| 02. | ගාල්ල කාර්මික විද්‍යාලය | කළුවැල්ල, ගාල්ල | ගාල්ල |
| 03. | මහනුවර කාර්මික විද්‍යාලය | අරුප්පල, මහනුවර | මහනුවර |
| 04. | යාපනය කාර්මික විද්‍යාලය | බ්‍රවුන්ස් පාර, යාපනය | යාපනය |
| 05. | බදුල්ල කාර්මික විද්‍යාලය | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | බදුල්ල |
| 06. | කෑගල්ල කාර්මික විද්‍යාලය | කච්චේරි පාර, කෑගල්ල | කෑගල්ල |
| 07. | අනුරාධපුරය කාර්මික විද්‍යාලය | නව නගරය, අනුරාධපුරය | අනුරාධපුරය |
| 08. | කුරුණෑගල කාර්මික විද්‍යාලය | පුත්තලම් පාර, කුරුණෑගල | කුරුණෑගල |
| 09. | රත්මලාන කාර්මික විද්‍යාලය | ගාලු පාර, රත්මලාන | කොළඹ |
| 10. | අම්පාර හාඩි කාර්මික විද්‍යාලය | ඉහිනියාගල පාර, අම්පාර | අම්පාර |
| 11. | මාතර කාර්මික විද්‍යාලය | මැද්දෙවත්ත, මාතර | මාතර |
| 12. | සම්මන්තුරේකාර්මික විද්‍යාලය | අම්පාර පාර, සම්මන්තුරේ | අම්පාර |
| 13. | කළුතර කාර්මික විද්‍යාලය | කලමුල්ල, කළුතර | කළුතර |
| 14. | රත්නපුරය කාර්මික විද්‍යාලය | ෆාම් ගාර්ඩින්, කොළඹ පාර, රත්නපුරය | රත්නපුරය |
| 15. | වරකාපොල කාර්මික විද්‍යාලය | අඹගල පාර, වරකාපොල | කෑගල්ල |
| 16. | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | පන්නල පාර, කුලියාපිටිය | කුරුණෑගල |
| 17. | පාතදුම්බර කාර්මික විද්‍යාලය | නවයාලතැන්න, කටුගස්තොට | මහනුවර |
| 18. | නුවරඑළිය කාර්මික විද්‍යාලය | ජයතිලක මාවත, නුවරඑළිය | නුවරඑළිය |
| 19. | හෝමාගම කාර්මික විද්‍යාලය | ගොඩගම, හෝමාගම | කොළඹ |
| 20. | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | පුවක්දණ්ඩාව, බෙලිඅත්ත | හම්බන්තොට |
| 21. | හසලක කාර්මික විද්‍යාලය | යෝධ ඇල පාර, හසලක | මහනුවර |
| 22. | දඹුල්ල කාර්මික විද්‍යාලය | මාතලේ පාර, දඹුල්ල | මාතලේ |
| 23. | බලපිටිය කාර්මික විද්‍යාලය | වඳුරුව දුම්රියපොළ පාර, බලපිටිය | ගාල්ල |
| 24. | වාරියපොල කාර්මික විද්‍යාලය | හලාවත පාර, වාරියපොල | කුරුණෑගල |

| අනු අංකය | කාර්මික විද්‍යාලය | ලිපිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| 25. | මඩකලපුව කාර්මික විද්‍යාලය | මන්චන්තුඩුවෙයි, මඩකලපුව | මඩකලපුව |
| 26. | බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | වැවතැන්න, බණ්ඩාරවෙල | බදුල්ල |
| 27. | මොණරාගල කාර්මික විද්‍යාලය | සිරිගල, මොණරාගල | මොණරාගල |
| 28. | ගම්පහ කාර්මික විද්‍යාලය | වැරැල්ලවත්ත, යක්කල | ගම්පහ |
| 29. | ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය | මිහිඳුපුර, ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය |
| 30. | දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය | මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය | අම්පාර |
| 31. | මාතලේ කාර්මික විද්‍යාලය | එම්. සී. පාර, මාතලේ | මාතලේ |
| 32. | වීරවිල කාර්මික විද්‍යාලය | නව නගරය, වීරවිල | හම්බන්තොට |
| 33. | මැදගම කාර්මික විද්‍යාලය | මැදගම, බිබිලේ හරහා | මොණරාගල |
| 34. | පොළොන්නරුව කාර්මික විද්‍යාලය | විද්‍යාපුර, පොළොන්නරුව | පොළොන්-නරුව |
| 35. | ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය | නව නගරය, ඇඹිලිපිටිය | රත්නපුර |
| 36. | වවුනියාව කාර්මික විද්‍යාලය | මන්නාරම පර, වවුනියාව | වවුනියාව |
| 37. | අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය | අක්කරෙයිපත්තුව | අම්පාර |
| 38. | ආණමඩුව කාර්මික විද්‍යාලය | ගම් උදා භූමිය, තම්මැන්නාගම, ආණමඩුව. | පුත්තලම |

07-577

---

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා මුද්‍රණ සේවයේ **III** වැනි පන්තියේ **III** වැනි ශ්‍රේණියේ පොත් බඳින්නා තනතුරු

ශ්‍රී ලංකා මුද්‍රණ සේවයේ III වැනි පන්තියේ III වැනි ශ්‍රේණියේ පොත් බඳින්නා තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයෙහි සඳහන් පරිදි වූ අයදුම්පත් 2007.08.27 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 08, අංක 118, දොස්තර ඩබ්ලිව්. ඩැනිස්ටර් ද සිල්වා මාවත, තැ.පෙ. 507, රජයේ මුද්‍රණාලයාධිපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ "පොත් බඳින්නා තනතුර" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

*සටහන :* (අ) ඉල්ලුම්පත්‍රය හෝ ඒ සම්බන්ධ ලිපි රජයේ මුද්‍රණාලයාධිපති හැර කිසියම් නිලධාරියෙකුගේ නමින් නොඑවිය යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍රය හෝ අදාළ ලිපියක් තැපෑලේදී නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ සම්බන්ධව කරනු ලබන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක.

(ඇ) දැනටමත් රජයේ හෝ සංස්ථා සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

02. *වැටුප්* :-මෙම තනතුර සඳහා ඒකාබද්ධ වාර්ෂික වැටුප් පරිමාණ රු. 173040 - 10 x 1,680 - 11 x 1,800 - 6 x 2,520 - 14 x 3480 - 273480

03. *වයස් සීමාව* :-2007.08.27 වැනි දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

*සටහන.*–දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :-

(අ) පිළිගත් ආයතනයක පොත් බැඳීම් වෘත්තියෙහි යටත් පිරිසෙයින් අවුරුදු 10කට නොඅඩු පළපුරුද්දක් තිබීම. (මේ සඳහා ආධුනික කාලය ද ඇතුළත් කළ හැකිය.)

හෝ

(ආ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ පොත් බැඳීම් පිළිබඳව තුන් අවුරුදු පාඨමාලාව හැදෑරීමෙන් පසුව ලබාගත් සහතිකය සමඟ පිළිගත් ආයතනයක පොත් බැඳීම් පිළිබඳව අවුරුදු 05ක පළපුරුද්දක් තිබිය යුතුය.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි*-තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

06. *සාමාන්‍ය කොන්දේසි* :-ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 12 : 1 හා 12 : 6 සිට 12 : 12 වගන්ති අදාළ වේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :-විධිමත් තේරීම් මණ්ඩලයක් විසින් සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව වැඩි සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් පුරප්පාඩු අනුව බඳවා ගනු ලැබේ.

08. මෙම *ගැසට් පත්‍රයේ* (I) වැනි කොටස (IIඅ) ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

ලක්ෂමන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති.

2007 ජූලි මස 27 වැනි දින,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
තැ. පෙ. 507,
කොළඹ 08.
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ අයදුම්පත්‍රය

*රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව*

*ශ්‍රී ලංකා මුද්‍රණ සේවයේ III වැනි පන්තියේ III වැනි ශ්‍රේණියේ පොත් බඳින්නා තනතුරු*

01. (අ) සම්පූර්ණ නම :———.
(ආ) මුලකුරු සමඟ නම :———.

02. (අ) තැපැල් ලිපිනය :———.
(ආ) ස්ථිර ලිපිනය :———.

03. දිස්ත්‍රික්කය :———.

04. (අ) උපන් දිනය :
වර්ෂය :———. මාසය :———. දිනය :———.
(ආ) 2007.08.27 දිනට වයස :
අවු. :———. මාස. :———. දින :———.

05. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :———.

06. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :———.

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

| විභාගයේ නම | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| | | |

07. වෘත්තීය සුදුසුකම්:———.
(සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.)

08. වර්තමාන රැකියාව (සේව්‍යයාගේ නම සහ ලිපිනය) :———.

09. මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද :———.

| ආයතනය | තනතුර | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

10. යම් කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත් ද යන වග :———.

ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර දන්වන්න.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව මම ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් මා නුසුදුස්සකු කිරීමට යටත් වන බවත් පත් කරනු ලැබුවායින් පසු සොයා ගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කරන්නේ නම් දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානියාගේ මාර්ගයෙන් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.)

දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානියාගේ සහතිකය

............................................. මහතා/මහත්මිය මෙම දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සේවයේ නියුතු බව ද, මොහුගේ /මැයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද මෙම තනතුරට අදාළ නිවේදනයේ දැක්වෙන පරිදි මෙම තනතුරට අයදුම්කිරීමට සුදුසුකම් සපුරන ලද බව ද, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

———.
දෙපාර්තමේන්තු/සංස්ථා
ප්‍රධානියාගේ/බලයලත්
නිලධාරියාගේ අත්සන.

නම :———,

තනතුර :———,

ලිපිනය :———,

දිනය :———.

07-601

---

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු ඇබෑර්තු

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අදාල සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියළුම අයදුම්පත් මෙයට යාකර ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කර අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනයට 2007.08.17 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය. (ඉහත කරුණට අදාලව අංක 1485 හා 2007.02.15 දින *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයට අනුව අයදුම්කරන ලද අයදුම්කරුවන් සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය මෙයින් අවලංගු කරමි.)

01. *වැටුප් ක්‍රමය*

01.1 මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය
රු. 28,095 - 5 x 645 - 5 x 750 - 35,270 (වැටුප් කේතය - එස් එල් 5)

02. *සුදුසුකම්*
*සෑම අයදුම්කරුවෙකුම*

02.1 විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

02.2 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

02.3 2007.08.17 දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත)

02.4 අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු විය යුතුය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය*

03.1 විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

03.2 මෙම පත්වීම් කෙරෙනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගිනි.

04. *සේවා කොන්දේසි*

04.1 තනතුරට පත්වූ දින සිට වසර තුනක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. (1 පරිශිෂ්ඨයෙහි දැක්වේ)

04.2 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

04.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග වලටද ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද මුදල් රෙගුලාසිවලටද කොමිෂන් සභා නියෝග වලට ද රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝග වලටද අනුකූලව ක්‍රියා කළ යුතුය.

04.4 පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ. දැනට රජයේ ස්ථිර තනතුරක් දරන්නෙකු තෝරාපත් කරගනු ලැබුවහොත් ඔහු හෝ ඇය එක් අවුරුද්දක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ලැබේ.

04.5 බඳවා ගනු ලබන නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවනතාවයක් සේවයට බැඳී වසර පහක් තුළ ලබාගත යුතුය.

05. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය.

06. දැනුම් දීමක් කළවිට අයදුම්කරුවන් පහත සඳහන් සහතික ඉදිරිපත් කළ යුතුය. එහෙත් අයදුම්පත්‍රයට කිසිදු සහතිකයක් අමුණා නොඑවිය යුතුය.

(i) අධ්‍යාපන සහතික;

(ii) උප්පැන්න සහතිකය;

(iii) ජාතික හැඳුනුම්පත;

(iv) පළපුරුද්ද පිළිබඳ සහතික (අධිකරණ නිලධාරියෙකු හෝ අවම වශයෙන් වසර 10කට නොඅඩු වෘත්තීය පළපුරුද්ද ඇති නීතිඥවරයෙකු විසින් නිකුත් කරන ලද සහතිකවලින් සනාථ විය යුතුය.)

(v) චරිත සහතික දෙකක් (මින් එකක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් විය යුතුය.)

අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ. මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අතින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පියසේන රණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව.

2007 ජූලි මස 12 වැනි දින,
කොළඹ 07.
මලලසේකර මාවත,
අංක 36,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

## ආදර්ශ අයදුම්පත්‍රය

*අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව*
*සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර*

1. (i) මුලකුරු සමග————————. මහතා/මිය/මෙනවිය

(ii) සම්පූර්ණ නම ————————.මහතා/මිය/මෙනවිය

2. ලිපිනය :

(i) පුද්ගලික ලිපිනය :————————.

(ii) රාජකාරි ලිපිනය :————————.
(රාජ්‍ය සේවයේ නියුක්ත නම්)

3. උපන් දිනය :-

(i) අවුරුද්ද:————. මාසය:————. දිනය :————.

(ii) 2007.08.17 …………… දිනට වයස :

අවු. :—————. මාස:—————. දින:—————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

5. ජන වර්ගය :———————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :———————.

7. (i) අධ්‍යාපන සුදුසුකම් :———————.

(ii) වෘත්තීය සුදුසුකම්:————————.

2007.08.17 දිනට වෘත්තීය පළපුරුද්ද

අවුරුදු :—————. මාස :—————. දින :—————.

8. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධූරය හැරගිය අයෙකු ලෙස සලකනු ලැබූ කෙනෙක්ද යන වග :———————.

9. (i) කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද? :——————.

(ii) පිළිතුර ඔව් නම් ඒ පිළිබඳ විස්තර :———————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සෙකු වීමට හේතු වන බවත් පත්කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්,*

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

................. මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————.

නම:————————.

තනතුර:————————.

දෙපාර්තමේන්තුව:————————.

(නිල මුද්‍රාව සහිතව)

**පරිශිෂ්ටය 1**

*කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නිර්දේශ පත්‍රය* :

කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ඇතුළත් පැය තුනක ප්‍රශ්න පත්‍රයකි (ලකුණු 100කි)

1. *ආයතන සංග්‍රහය* :— II, VII, XII, XIII, XVI, XXVIII, XXX, XLVII, XLVIII පරිච්ඡේද;
2. *මුදල් රෙගුලාසි* :— I, II, III, IV, V, VI, VII, VIII, IX, X, XI, XII, XIII, XIV පරිච්ඡේද;
3. *දෙපාර්තමේන්තු රෙගුලාසි* :— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂමට අදාල චක්‍රලේඛ උපදෙස් හා රෙගුලාසි.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත යුතුවේ.

07- 580

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය

ජාතික වෘත්තීය පුහුණු ආයතනය - රත්මලාන

**2007 II වන අර්ධ වර්ෂය සඳහා ආධුනික ආධුනිකාවන් බඳවා ගැනීම**

*පහත දැක්වෙන පාඨමාලා සඳහා ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.*

| *පාඨමාලාව* | *පාඨමාලා කාලය* | *අයකරන ගාස්තු* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| පරිගණක දෘඩාංග ශිල්පී (Computer Hardware Technician) | මාස 06 | රු.9,000 | අ.පො.ස. (සා.පෙ.) ගණිතය, ඉංග්‍රීසි සඳහා සම්මාන සහිතව සමත්වීම |
| පරිගණක යෙදුම් සහයක (Computer Application Assistant) | මාස 06 | රු. 3,000 | අ.පො.ස. (සා.පෙ.) ගණිතය, ඉංග්‍රීසි සඳහා සම්මාන සහිතව සමත්වීම |
| ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික ශිල්පී (Aluminium Fabricator) | මාස 06 | රු.1,500 | අ.පො.ස. (සා.පෙ.) පෙනී සිටීම |
| පෙදරේරු ශිල්පී (Mason) | මාස 06 | නොමිලේ | 09 වසර සමත් |
| ජලනල කාර්මික ශිල්පී (Plumbing) | මාස 06 | නොමිලේ | 09 වසර සමත් |
| වඩු කාර්මික ශිල්පී (ගෘහභාණ්ඩ) (Carpenter-Furniture) | මාස 12 | නොමිලේ | 09 වසර සමත් |
| මෝටර් රථ වැද්දුම් ශිල්පී (Automobile Tinker) | මාස 06 | නොමිලේ | 09 වසර සමත් |
| උපකරණ තාක්ෂණ ශිල්පී (Instrument Technician Electronic, Electrical, Pneumatics Process Control) | මාස 18 | රු. 12,000 | අ.පො.ස. (සා.පෙ.) ගණිතය, විද්‍යාව, සම්මාන සහිතව සහ (උ.පෙ.) ගණිත, විද්‍යා අංශයෙන් පෙනී සිටීම. |

ඉහත පාඨමාලා හදාරන ඔබට/ඔබේ දරුවාට පුහුණු කාලය තුළ ලැබෙන පහසුකම් :-

* දුෂ්කර දුර බැහැර පෙදෙස්වල ආධුනිකයන් සඳහා නේවාසික පහසුකම්;
* අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව;
* රැකියා ලොව ඉහළ පිළිගැනීමකට ලක්වූ වෘත්තීය නිපුණතා මට්ටමේ සහතික (රජයේ පිළිගත් වෘත්තීය පුහුණු සහතිකයක්);
* තෝරාගත් පුහුණු පාඨමාලා සඳහා මාසික දීමනාවක්;
* වෘත්තීය මාර්ගෝපදේශනය සහ ව්‍යවසායකත්ව දැනුම;
* ස්වයං රැකියා ආරම්භ කරන්නන් සඳහා ණය පහසුකම්;
* ලංගම මගී වාර ප්‍රවේශ පත්‍ර.

*විශේෂයි* :-

* කාන්තා අයදුම්කාරියන් සඳහා ප්‍රමුඛත්වය
* දුර බැහැර පෙදෙස්වල අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය
* වයස අවුරුදු 18-30 අතර වීම

*පාඨමාලා සඳහා අයදුම්කිරීම.*–ඔබේ පෞද්ගලික තොරතුරු, දක්ෂතා, රුචිකත්වයන් ඇතුළත් කර ඔබ විසින්ම සකස් කරන ලද අයදුම්පතක් පහත ලිපිනයට 2007.08.15 දිනට පෙර යොමුකරන්න.

සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 100, කඳවල පාර,
රත්මලාන.

දුරකථන අංක : 011-2638850

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

07-624

---

## උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

### උසස් තාක්ෂණ ආයතනය - මට්ටක්කුලිය

### *උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවට සිසුන් ඇතුළත් කිරීම 2007/2008 අධ්‍යයන වර්ෂය*

යථෝක්ත පාඨමාලාව සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පූර්ණකාලීන තුන් අවුරුදු න්‍යායික හා හය මාසික වැඩබිම් පුහුණුව ඇතුළත් පාඨමාලාවක් වන අතර සිවිල්, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු යන විශේෂිත ඉංජිනේරු ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වේ. මෙම පාඨමාලාව හදාරා ලන්ඩන් ඉංජිනේරු මණ්ඩලය මගින් තීරණය කරනු ලබන කුසලතා සාමාර්ථ සංඛ්‍යාවක් ලබා ගැනීම CEI (ලන්ඩන්) විභාගයේ පළමු අදියරෙන් නිදහස් වීම සඳහා සුදුසුකමක් වනු ඇත.

පාඨමාලාව සඳහා බඳවා ගැනීමට සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

01. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

02. (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් විසින් 2006 වර්ෂයේ හෝ ඊට පෙර පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ (පැරණි නිර්දේශය) විභාගයේ දී පහත සඳහන් විෂයයන් හතරෙන් එකවර සමත්වී තිබීම.
   (i) ව්‍යවහාරික ගණිතය,
   (ii) ශුද්ධ ගණිතය,
   (iii) භෞතික විද්‍යාව,
   (iv) රසායන විද්‍යාව.

   (ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් විසින් 2006 වර්ෂයේ හෝ ඊට පෙර පවත්වන ලද නව නිර්දේශයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය හදාරණ ලද අයදුම්කරුවන් අවම වශයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුනෙන් එක්වර සමත්ව තිබිය යුතුය.

03. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 23ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

අයදුම්කරුවන් සතියේ දිනයන්හි පාඨමාලාවන් සඳහා සහභාගී වීමට නිදහස් විය යුතු අතර සති අන්තයේදී ද අවශ්‍යතා අනුව පාඨමාලා කටයුතුවලට සහභාගී වීමට හැකි විය යුතුය.

අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරගත යුතුය.

ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේදී අ.පො.ස. (උ.පෙළ) ලකුණුවල සාමාන්‍ය හෝ Z - Score සැලකිල්ලට ගනු ලැබේ.

අයදුම්පත්‍ර ගාස්තුව රු. 250 කි. එම ගාස්තු මුදල මහජන බැංකුව, හයිඩ් පාර්ක් කෝනර් ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් 025100133397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ජංගම ගිණුමට බැරකර ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතට ඇමිණිය යුතුය.

නියමිත අයුරින් සකස්කළ අයදුම්පත්‍ර අධ්‍යක්ෂිකා, උසස් තාක්ෂණ ආයතනය, අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15 යන ලිපිනයට 2007.08.17 දිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. "උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය 2006/2007" යන්න ලියුම් කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි සටහන් කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම් වලට බැරකරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක, අනුබද්ධිත විශ්ව විද්‍යාල ආයතනයක, කාර්මික විද්‍යාලයක, අධ්‍යාපන විද්‍යා පීඨයක/ගුරු පුහුණු ආයතනයක හෝ වෙනත් උසස් තාක්ෂණ ආයතනයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීම සඳහා බඳවා ගැනීමට සුදුසුකම් නොලබයි. කිසියම් ශිෂ්‍යයෙකු එකම කාලය තුළ දී වෙනත් ඉහත දැක්වූ රාජ්‍ය ආයතනයක පූර්ණ කාලීන ශිෂ්‍යයෙකු ලෙස පාඨමාලාවක් හදාරන බව හෙළිදරව් වුවහොත් ඇයගේ/ඔහුගේ ලියාපදිංචිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් අවලංගු කරන බව ද සැලකිය යුතුය.

මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු අංශයට 2007/2008 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන බව කරුණාවෙන් සලකන්න.

එච්. ටී. කමල් පත්මසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,
අංක 18/2, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය**

උසස් තාක්ෂණ ආයතනය - මට්ටක්කුලිය 2007/2008 අධ්‍යයන වර්ෂය

උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ.ජා.ඉ.ඩි.) පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :

02. මුලකුරු වලින් කියවෙන නම :

03. ජාතික හැඳුනුම්පත් අංකය : 04. උපන් දිනය : 05. ස්ත්‍රී/පුරුෂ භාවය :

06. ස්ථිර ලිපිනය : (පහත කොටුවෙහි ලියන්න)

07. පරිපාලන දිස්ත්‍රික්කය :

08. වඩාත් කැමති ඉංජිනේරු ක්ෂේත්‍රයන් පිළිවෙලින් :

| | |
|---|---|
| පළමු තේරීම | |
| දෙවැනි තේරීම | |
| තෙවන තේරීම | |

09. ඉංග්‍රීසි විෂය පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ලත් ප්‍රතිඵල :

| වර්ෂය | විභාගය | විභාග අංකය | ලබාගත් සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

10. ඔබගේ අ.පො.ස. (උ.පෙළ,) විභාගයේ හොඳම ප්‍රතිඵල (2006 හෝ ඊට පෙර):

| වර්ෂය | පාඨමාලාව | | විභාග අංකය | මාධ්‍යය |
|---|---|---|---|---|
| | පැරණි | නව | | |

පැරණි නිර්දේශය / නව නිර්දේශය

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. ව්‍යවහාරික ගණිතය | | 1. සංයුක්ත ගණිතය | |
| 2. ශුද්ධ ගණිතය | | 2. භෞතික විද්‍යාව | |
| 3. රසායන විද්‍යාව | | 3. රසායන විද්‍යාව | |
| 4. භෞතික විද්‍යාව | | 4. සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| මුළු ලකුණු එකතුව/ Z-score | | මුළු ලකුණු එකතුව/ Z-score | |

| අවස්ථාව | පළමුවන | | දෙවන | | තුන්වන | |
|---|---|---|---|---|---|---|

මම වෙනත් රාජ්‍ය ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරන්නේ නැති බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. වෙනත් රාජ්‍ය ආයතනයක එකම කාලය තුළදී වෙනත් පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරන බව හෙළිදරව් වුවහොත් මාගේ ලියාපදිංචිය අවලංගු වන බව දනිමි. මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(රු.250 මුදල් ගෙවූ බවට බැංකු කුවිතාන්සිය අමුණන්න.)

07-628

---

## නොතාරිස් අවසාන විභාගය - 2006 නොවැම්බර්

මෙහි පහත සඳහන් අයදුම්කරුවන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති භාෂාවෙන් නොතාරිස්වරුන් වශයෙන් කටයුතු කිරීම සඳහා නොතාරිස් අවසාන විභාගය සමත් වී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. ජී. ඒ. ප්‍රේමරත්න මහතා සිංහල
2. ඒ. ටී. ගුණවර්ධන මහතා සිංහල
3. කේ. එම්. පී. පී. ගුණසේකර මහතා සිංහල
4. ජේ. ඇස්කි මහතා සිංහල
5. ඩී. එම්. කේ. බී. දිසානායක මහතා සිංහල
6. එච්. එම්. ශ්‍රී ලාල් සිල්වා මහතා සිංහල
7. ආර්. එම්. රත්නායක මහතා සිංහල
8. යූ. එස්. ආර්. වීරක්කොඩි මිය සිංහල
9. එම්. වයි. එල්. එම්. ඒ. කාදර් මහතා දෙමළ
10. ඒ. එම්. එම්. සුබයිර් මහතා දෙමළ
11. ආර්. ඒ. ඊ. එන්. රූපසිංහ මිය සිංහල
12. එම්. ඉසඩීන් මහතා දෙමළ
13. එම්. එස්. එම්. රූමි මහතා දෙමළ
14. එස්. ආර්. පොඩිරාලහාමි මහතා සිංහල
15. ආර්. එම්. එස්. පෙරේරා මිය සිංහල
16. ජී. එස්. එස්. ප්‍රනාන්දු මිය සිංහල
17. ඩබ්ලිව්. ඩී. ජයවර්ධන මිය සිංහල
18. වී. පී. ඩබ්ලිව්. ලක්මාලි මිය සිංහල
19. ටී. පී. වී. එෆ්. ප්‍රනාන්දු මිය සිංහල
20. පී. එල්. සෝමසිරි මහතා සිංහල
21. එම්. එස්. නජීම් මහතා දෙමළ
22. එච්. ඩී. එල්. ප්‍රනාන්දු මිය සිංහල

| | | |
|---|---|---|
| 23. | එම්. එල්. අලියාර් මහතා | දෙමළ |
| 24. | බී. ඒ. ලොකුබණ්ඩා මහතා | සිංහල |
| 25. | එස්. එම්. ගයාන් ඉන්දික මහතා | සිංහල |
| 26. | එම්. එම්. එම්. ජේ. එම්. බෝගමුව මිය | සිංහල |
| 27. | ඩී. එම්. යූ. ටී. බී. දිසානායක මහතා | සිංහල |
| 28. | එම්. ඒ. ප්‍රනාන්දු මහතා | සිංහල |
| 29. | එස්. එම්. යූ. සේනාධිපති මිය | සිංහල |
| 30. | බී. එම්. ටිකිරිබණ්ඩා මහතා | සිංහල |
| 31. | ටී. ඒ. රවීන්ද්‍ර පෙරේරා මහතා | සිංහල |
| 32. | එස්. මුතුකුමාරස්වාමි මහතා | දෙමළ |

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 ජූලි මස 11 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11.

07–561

---

## ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

### SRI LANKA INSTITUTE OF PRINTING

(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මාතලේ සහ බේරුවල ශාඛා පාඨමාලා

තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන කොළඹ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති ශාඛාවන් මගින් පහත සඳහන් පාඨමාලා 2007 ජූලි/අගෝස්තු මස නැවතත් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන පරිගණක මුද්‍රණ රටා (සිත්තම්) නිර්මාණය පිළිබඳ පාඨමාලාව
Certificate Course in Computer Graphic Designing

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාල පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින රජයේ මුද්‍රණ ආයතනය, එම ක්ෂේත්‍රයට අදාල දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් පවත්වනු ලබන මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාවන් මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකසා ඇත.

පරිගණක ආශ්‍රිත රූ රටා නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
Certificate Course in Computer Graphic Designing

මෙම පාඨමාලාව ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත්වීමට බලාපොරොත්තුවන නවකයින්ට මෙන්ම එම ක්ෂේත්‍රයන් හි නියැලී සිටින සේවක මහතුන් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිගණක ආධාරයෙන් ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාල මෘදුකාංග පිළිබඳ පුළුල් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ද ලබාදෙයි.

පාඨමාලා කාලය : මාස 04 යි
මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි
දින : සතිපතා සහ සති අන්ත පන්ති කීපයක් පැවැත්වේ. ගාස්තුව රු. 8000 කි.

Course Outline

* Introduction to Computers
  (Hard Ware and Soft Ware for Graphics Industry)

* Introduction to Adobe-Indesign for Page Make-up

* Creating and Designing Vector Graphics using Macro Media Free Hand

* Creating and Designing Vector Graphics using Corel Drow

* Creating and Designing Vector Graphics using Adobe Illustrator.

* Light and Colour
  Colour Theory (Pantone Traditional CMYK and Hexachrome)

* How to use Adobe Photoshop as a Raster Graphic Image manipulation application
  Photoshop and Tools
  Image Correction and Image Manipulation
  Colour Corrections and Adjustment
  2D - 3D in Photoshop
  Image Modes and Blending Modes
  Photoshop inbuilt and Third party plug-in Filters
  Using Layers, Channels and Basic Palettes
  Working with paths and vector shapes
  Masking Systems in Photoshop

* **Scanning Technology**: How to use Scanner for printing Technology (From Black and White to Colour)

  **Out Put Techniques**: Colour Separations and Special Colour out putting.

02. පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පරිගණක ආශ්‍රිත මුද්‍රණය
**Certificate Course in Computer Typesetting and Desk Top Publishing**

ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත්වීමට බලාපොරොත්තුවන නවකයන් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි. පරිගණක ආධාරයෙන් අකුරු ඇමිණීම පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර පරිගණක දැනුමත් මුල සිටම පරිගණක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය (**Computers and Software applications)** පිළිබඳව මනා දැනුමක් හා සිත්තම් නිර්මාණය **(Certificate Course in Graphic Designing)** පිළිබඳ මූලික අවබෝධයක් ද ලබාදෙන අතර, මෙම පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය මූලික දැනුම සහ පුහුණුව ලබාදෙයි.

පාඨමාලා කාලය : පැය 148 යි (මාස 5)
මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි
ගාස්තු : රු. 7000/-
දින : සතිපතා සහ සතිඅන්ත පන්ති කීපයක් පැවැත්වේ.

පාඨමාලා අන්තර්ගතය (Course Contents)

* Introduction to Computers
* Keyboard training and Fonts
* Word Processing using MS Word
* Page Make-up methods using Adobe Page Maker
* Introduction to Scanning and Image Manipulation
* Introduction Vector Graphic Application
* Page Make-up Methods using Quark Xpress

අගෝස්තු මස පැවැත්වෙන උ/පෙළ විභාගයෙන් පසු ආරම්භ කිරීම සඳහා සීමිත සිසුන් සංඛ්‍යාවක් ඇතුළුවිය හැකි විශේෂ පංති කීපයක් ද සංවිධානය කර ඇත. ඒ සඳහා කළින් පැමිණ ආසනයක් වෙන්කරවා ගන්න.

මෙම පාඨමාලාවන්ට ඇතුළත්වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරාගනු ලබන අපේක්ෂකයන්ට පමණක් පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබේ. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

ශාඛාවල හඳුන්වා දී ඇති මෙම පරිගණක ආශ්‍රිත රූ රටා නිර්මාණය පිළිබඳ පාඨමාලාව හැදෑරීමෙන් කොළඹ පිහිටි ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ප්‍රධාන ශාඛාව මගින් හඳුන්වා දෙන මුද්‍රණ, දෘෂ්‍ය සන්නිවේදන සහ කළමණාකරණ විෂයයන් ආශ්‍රිත උසස් ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත්වීමට අවශ්‍ය මූලික සුදුසුකම් සමහරක් ද සපුරා ගත හැක.

*විමසීම් සහ ඇතුළත්වීම් සඳහා පහත ලිපිනයෙන් අමතන්න.*

*මාතලේ ශාඛාව* :

සමන්ත කුලතුංග,
පාඨමාලා උපදේශක,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
මාතලේ ශාඛාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකථන අංකය : 071-4895044

*බේරුවල ශාඛාව* :

හරිත වැන්දබෝනා,
පාඨමාලා උපදේශක,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
බේරුවල ශාඛාව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බේරුවල.
දුරකථන අංකය: 034-2279881, 0714-286261.

කොළඹ 08, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ රජයේ මුද්‍රණ මුද්‍රණාලයීය ගොඩනැගිල්ලේ පිහිටි ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ප්‍රධාන කාර්යාලයෙන් දුරකථන අංක 2686162 හෝ 2679791 අමතා කථා කිරීමෙන් ද වැඩි විස්තර ලබා ගත හැක.

මෙම පාඨමාලාවට බඳවා ගනු ලබන්නේ සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් නිසා මුලින් ඇතුළත්වන අයට අවස්ථාව සැලසේ.

*ප්‍රධාන ශාඛාව* :

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන අංක : 0112 - 686162, 0112 - 679791.
ෆැක්ස් : 0112-686162.

07-625

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.